## 2024-07-01 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

01. **ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම**

ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු සඳහා කාන්තා සහභාගිත්වය විවිධ කරුණු හේතුවෙන් අනෙකුත් කලාපීය හා ආසියානු රටවලට වඩා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය කරනු ලැබ ඇත. 2022 වර්ෂයේදී සිදු කරන ලද ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය පිළිබඳ සමීක්ෂණයට අනුව, ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනයෙන් 35%ක් කාන්තාවන් වන අතර, එමඟින් ආර්ථික සහභාගිත්වයේ ස්ත්‍රී-පුරුෂ දායකත්ව අනුපාතවල සැලකිය යුතු විෂමතාවක් නිරූපණය වේ. සීමිත මූල්‍ය සාක්ෂරතාව සහ ණය ලබා ගැනීම සඳහා අවශ්‍ය වන දේපළ හෝ වෙනත් ඇප හිමිකමක් කාන්තාවන්ට නොමැති වීම ආදී මූල්‍ය සම්පත් වෙත ප්‍රවේශ වීම සඳහා පවතින අවස්ථා අවම වීම යන කරුණු ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායකයන් මුහුණ දෙන ප්‍රධාන බාධක ලෙස හඳුනා ගනු ලැබ ඇත. එබැවින්, 2024-02-26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නැවත ශක්තිමත් කිරීම සඳහා ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට වෙන් කරනු ලැබ ඇති රුපියල් බිලියන 20ක ප්‍රතිපාදනවලින්, රුපියල් බිලියන 02ක් යොදා ගනිමින් කාන්තාවන්ට ආර්ථික කටයුතුවල නිරත වීම සඳහා ඇති බාධා ඉවත් කිරීම පිණිස විශේෂ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **මහබාගේ පොලිස් ස්ථානය සඳහා ඉඩම් කොටසක් ලබා දීම**

ග්‍රාම නිලධාරි වසම් 08ක් තුළ ජීවත් වන 50,000 කට ආසන්න ජනතාවක් සඳහා සේවා සපයනු ලබන මහබාගේ පොලිස් ස්ථානය දැනට කොළඹ - මීගමුව ප්‍රධාන මාර්ගයට මායිම්ව පිහිටි පර්චස් 21.5ක් වූ කුඩා භූමි ප්‍රමාණයක පවත්වාගෙන යනු ලබයි. එම තත්ත්වය මත රථවාහන ගාල් කිරීමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොතිබීම, නඩු භාණ්ඩ රඳවා තැබීමට සුදුසු ස්ථානයක් නොපැවතීම, භට නිවාස පහසුකම් ප්‍රමාණවත් නොවීම මෙන්ම නිල නිවාස නොතිබීම ආදී කාරුණු හේතුවෙන්

මහජනතාව හා සේවයේ නියුතු නිලධරයන් මහත් අපහසුතාවන්ට මුහුණ දෙමින් සිටී. එබැවින්, එම පොලිස් ස්ථානය සඳහා අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම පිණිස වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පූර්වයෙන් ස්ථාපිත කර තිබූ ඉඩමෙන් පර්චස් 40ක ප්‍රමාණයක් වෙන් කර දීම පිණිස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ආර්ථික කටයුතු පිළිබඳ ස්විට්සර්ලන්ත රාජ්‍ය ලේකම් කාර්යාලය අතර ගෝලීය රෙදිපිළි සහ ඇඟලුම් වැඩසටහන පිළිබඳ ව්‍යාපෘති ගිවිසුම**

ශ්‍රී ලංකාවේ රෙදිපිළි සහ ඇඟළුම් අංශය සඳහා ගෝලීය රෙදිපිළි සහ ඇඟළුම් වැඩසටහනේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම පිණිස ආර්ථික කටයුතු පිළිබඳ ස්විට්සර්ලන්ත රාජ්‍ය ලේකම් කාර්යාලය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය අතර ව්‍යාපෘති ගිවිසුමකට එළඹීමට යෝජනා වී ඇත. එම ගිවිසුමට එළඹීම මඟින් ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කරමින් ගුණාත්මක හරිත නිෂ්පාදන කරා මාරු වීමේ කාර්යය පාදක කරගෙන රෙදිපිළි සහ ඇඟළුම් කර්මාන්තයේ පරිවර්තනයක් සඳහා ගෝලීය රෙදිපිළි සහ ඇඟළුම් වැඩසටහනේ සහාය ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වනු ඇත. ඒ අනුව, එකී ගිවිසුමට අත්සන් තැබීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **ශ්‍රී ලංකාවේ තිරසර හා කාර්යක්ෂම විද්‍යුත් සංචලන පද්ධතිය පිළිබඳ ව්‍යාපෘතිය**

හරිත පාරිසරික අරමුදල විසින් ප්‍රතිතනය කරන ලද ආයතනයක් වන එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන ශ්‍රී ලංකාවේ තිරසර හා කාර්යක්ෂම විද්‍යුත් සංචලන පද්ධතිය පිළිබඳ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 1.09ක ප්‍රදානයක් ලබා දී ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලස්මට අනුව පරිසර අමාත්‍යාංශය ජාතික අස්තිත්වය වශයෙන් හඳුනා ගනු ලැබ ඇත. එහෙත්, ව්‍යාපෘති විෂය පථය ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතට ගැනෙන බැවින්, අදාළ සියලු පාර්ශ්වයන් සමඟ එක්ව වඩාත් කාර්යක්ෂමව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමේ හැකියාව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සතුව පවතී. ඒ අනුව, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ

නියෝජිතායතනය වශයෙන් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය කටයුතු කිරීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 05. ඉසිපතන විද්‍යාලයීය ක්‍රීඩා කටයුතු සඳහා හෙන්රි පේද්‍රිස් ක්‍රීඩාංගනය පවරා දීම

විවිධ දක්ෂතා දක්වන ක්‍රීඩකයන් රැසක් සිටින කොළඹ ඉසිපතන විද්‍යාලයට ක්‍රීඩා පුහුණුවීම් සඳහා ස්ථිර ක්‍රීඩා පිටියක් නොමැති වීම එම ක්‍රීඩාවන්හි නියැලෙන ක්‍රීඩකයන්ගේ දක්ෂතා වැඩිදියුණු කිරීමට ඉමහත් බාධාවක්ව පවතී. එබැවින්, කොළඹ මහ නගර සභාව සතු හෙන්රි පේද්‍රිස් ක්‍රීඩාංගනය ඉසිපතන විද්‍යාලයීය ක්‍රීඩා කටයුතු සඳහා යොදා ගැනීමට 2016 වර්ෂයේදී දෙපාර්ශ්වය අතර ගිවිසුමකට එළඹ ඇති අතර, එකී ගිවිසුමේ කාලසීමාව 2017 වර්ෂයේදී අවසන් වී තිබේ. හෙන්රි පේද්‍රිස් ක්‍රීඩාංගනය ඉසිපතන විද්‍යාලය වෙත පවරා දීම මඟින් එය නිසියාකාරව වැඩිදියුණු කොට පවත්වාගෙන යා හැකි අතර, එමඟින් එම විද්‍යාලයේ හා අවට පාසල්වල දරුවන්ගේ සහ ප්‍රදේශයේ ජනතාවගේ ක්‍රීඩා කටයුතු සඳහා ඵලදායී ලෙස යොදා ගැනීමට අවකාශය සැලසෙනු ඇත. ඒ අනුව, හෙන්රි පේද්‍රිස් ක්‍රීඩාංගනයේ නාමය එලෙසම පවත්වාගෙන යමින් එකී ක්‍රීඩාංගනය ඉසිපතන විද්‍යාලය වෙත පවරා දීම පිණිස ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. කල්මුණේ නගරයේ පිහිටි ඉඩම් කොටසක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීම

කල්මුණේ නගරය අම්පාර දිස්ත්‍රික්කයේ පවතින ප්‍රධාන සේවා මධ්‍යස්ථානවලින් එකක් වන අතර, එය පළාතේ පරිපාලන, වෙළෙඳ හා වාණිජ කේන්ද්‍රස්ථානයක් ලෙස සලකනු ලැබේ. කල්මුණේ මහනගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුව කල්මුණේ වෙරළබඩ ප්‍රදේශය සංචාරක හා විනෝදාකාමී කටයුතු සඳහා සුදුසු කලාපයක් ලෙස නම් කර ඇතත්, සංචාරක හා විනෝදාත්මක කටයුතු සඳහා එම නගරය තුළ පවතින පහසුකම් ප්‍රමාණවත් නොවන බව හඳුනාගනු ලැබ තිබේ. එබැවින්, එකී අවශ්‍යතා සපුරාලීම සඳහා කල්මුණේ වෙරළබඩ ප්‍රදේශයේ රෙස්ට් හවුස් මාර්ගයේ පිහිටි රූඩ් 01 පර්චස් 29.44ක් වන ඉඩම් කොටසක් සංචාරක පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් සඳහා නාගරික

සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **සම්මත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම යටතේ පුනර්ජනනීය බලශක්තිය මිල දී ගැනීමේ ගාස්තු සංශෝධනය කිරීම**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සහ එකී පනතට පසුව සිදු කරන ලද සංශෝධන අනුව මෙගාවොට් 10 හෝ ඊට අඩු ධාරිතාවයකින් යුත් පුනර්ජනනීය බලශක්තිය ව්‍යාපෘතිවලට අදාළව තාක්ෂණය මූල් කරගත්, පිරිවැය පරාවර්තක අවශෝෂක ගාස්තු (Feed In Tariff) ක්‍රමවේදයක් යටතේ සම්මත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුමකට එළඹිය යුතු වේ. ඒ අනුව, පුනර්ජනනීය බලශක්තිය මිල දී ගැනීමේ විචල්‍ය ගාස්තු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම පිණිස 2023-03-13 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති නමුත්, සංවර්ධකයින් කිහිපදෙනෙකු පමණක් ඒ සඳහා ගිවිසුම අත්සන් තැබීමට පියවර ගෙන ඇත. එබැවින්, පුනර්ජනනීය බලශක්තිය ගාස්තු ගණනය කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගැනීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ ශ්‍රී ලංකා මහ බැංකුව යන ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කරනු ලැබ ඇත. එකී කමිටුව විසින් ඉදිරිපත් කර ඇති මිල ගණනය කිරීමේ සූත්‍රය පිළිගැනීමටත්, යෝජිත ගාස්තු සංශෝධනයන් ක්‍රියාත්මක කිරීමටත් විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **ජාතික තත්ත්ව සභාව ස්ථාපිත කිරීම**

2016 වර්ෂයේදී ඉදිරිපත් කරනු ලැබ ඇති ජාතික තත්ත්ව ප්‍රතිපත්තිය, 2018-2022 ජාතික තත්ත්ව යටිතල පහසුකම් උපායමාර්ග සහ 2018-2022 ශ්‍රී ලංකා ජාතික අපනයන උපායමාර්ග මඟින් ජාතික තත්ත්ව සභාවක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව පෙන්වා දී තිබේ. මේ වන විට, ජාතික තත්ත්ව ආයතන සහ අනෙකුත් ජාතික තත්ත්ව නියාමන නියෝජිතායතන විවිධ රේඛීය අමාත්‍යාංශවල විෂය පථයන් යටතේ ස්වාධීන ආයතන වශයෙන් ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින්, ජාතික තත්ත්ව සභාව ස්ථාපිත කිරීමේ යෝජනාව ක්‍රියාත්මක කිරීම පිණිස පාර්ශ්වකාර රේඛීය අමාත්‍යාංශවල සහ

ජාතික තත්ත්ව ආයතනවල නියෝජනයන් සහිතව ක්‍රියාකාරී කමිටුවක් පත් කිරීම පිණිස වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 09. ඉන්දියානු රජය මඟින් යාපනය දිස්ත්‍රික්කයේ වැසි ජලය රැස්කිරීමේ ටැංකි 934ක් ඉදිකිරීම

යාපනය දිස්ත්‍රික්කය තුළ පිරිසිදු පානීය ජලය සපයා ගැනීම පිණිස ඉන්දීය රජය විසින් පිරිනමන ලද අරමුදල් උපයෝගී කර ගෙන එම දිස්ත්‍රික්කය තුළ වැසි ජලය එක්රැස් කිරීමේ ටැංකි 3,000ක් ඉදිකිරීමට ඉන්දීය රජය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම සඳහා 2016-10-25 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ව්‍යාපෘතිය වසර 03ක කාලසීමාවක් තුළ නිම කළ යුතුව පැවති නමුත්, පැන නැගී ඇති මූල්‍යමය හා තාක්ෂණික ගැටලු හේතුවෙන් 2024 ජුනි මාසය දක්වා ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීමටත්, ෆෙරෝ සිමෙන්ති ටැංකි වෙනුවට පීවීසී වැසි ජල ටැංකි 1,831ක් ස්ථාපිත කිරීමටත් 2022-10-10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ව්‍යාපෘතිය යටතේ තවදුරටත් ඉතිරිව පවත්නා අරමුදල්වලින් වැසි ජලය එක් රැස් කිරීමේ ටැංකි 934ක් ස්ථාපිත කිරීම පිණිස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 10. ජාතික තරුණ සේවා සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන තරුණ සංවර්ධන කාර්යයන් සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීම

යෞවනයන් අතර ඔරොත්තු දීමේ හැකියාව, ආත්ම අභිමානය හා අරමුණු පිළිබඳ හැඟීමක් ඇති කිරීම සහ ජීවිතයේ අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට හා අවස්ථාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට අවශ්‍ය කුසලතාවන්ගෙන් ඔවුන් සන්නද්ධ කිරීම අරමුණු කර ගනිමින් තරුණ ව්‍යවසායකයින් මිලියනයක් බිහි කිරීම, ජාතික සහ ගෝලීය ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ මාර්ගෝපදේශන, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තරුණ කඳවුරු පැවැත්වීම සහ ජාතික තරුණ සම්මේලනයක් පැවැත්වීම යන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජාතික තරුණ සේවා සභාව විසින් සැලසුම් කර ඇත. එකී වැඩසටහන් පැවැත්වීමටත්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජාතික තරුණ සේවා සභාව වෙත සලසා දීමටත් ක්‍රීඩා හා

යෞවන කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ සාදන ලද නියමයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

2024-03-25 සහ 2024-04-08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව, Codegen Innovation (Pvt) Ltd, Port City BPO (Pvt) Ltd, IVIVA PTE Ltd, Echelon Trade (Pvt) සහ 99X Technology AS යන සමාගම්, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාර ලෙස නම් කර, එම ව්‍යාපාර සඳහා යෝජිත නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් නියමයන් මඟින් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබ ඇති පහත සඳහන් නියමයන් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* අංක 2378/35 දරන 2024-04-05 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත නියමය.

  අංක 2380/36 දරන 2024-04-19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත නියමය.

* අංක 2380/33 දරන 2024-04-19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත නියමය.

* අංක 2380/35 දරන 2024-04-19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත නියමය.

* අංක 2380/34 දරන 2024-04-19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත නියමය.

12. **අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත**

යම් වූදිතයෙක් ඔහුට චෝදනා එල්ල කරන ලද වරදට වරදකරු බව තීරණය කිරීමට පෙර, එම වූදිතයා බන්ධනාගාරගතව ගත කරන කාලය ද ඔහුගේ දඬුවම් කාලයෙන් කොටසක් වශයෙන් සලකා බැලීමට විනිසුරුවන්ට හැකි වන පරිදි විධිවිධාන සැලසීම සඳහා 2024 අංක 25 දරන අපරාධ නඩු විධාන සංශෝධන පනත 2024-05-31 දින

පාර්ලිමේන්තුවේ සම්මත කර ඇත. එසේ වුවද, එකී සංශෝධිත පනත සම්මත වීමට පෙර වරදකරුවන් බවට ප්‍රකාශ කරන ලද තැනැත්තන්ට ඉහත සංශෝධිත පනත අදාළ නොවන බැවින්, ඔවුන් සම්බන්ධයෙන් ද වරදකරු බවට තීන්දු කරන නෙක් හෝ අභියාචනයේ තීන්දුව ලැබෙන තෙක් බන්ධනාගාරගතව සිටි කාලසීමාව සලකා බැලීම පිණිස යාන්ත්‍රණයක් අවශ්‍ය බව හඳුනාගෙන තිබේ. ඒ අනුව, එවැනි වරදකරුවන් සම්බන්ධයෙන් ද අවශ්‍ය පියවර ගැනීමට හැකි වන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සතු බලතල ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ විධිවිධාන නීතියක් හඳුන්වා දීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් ලබා දීම සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**13. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම**

විශ්‍රාම වැටුපකට හිමිකම් නොමැති පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සේවකයින්ගේ සමාජ ආරක්ෂණය වෙනුවෙන් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත මඟින් සේවක අර්ථසාධක අරමුදල පිහිටුවා ඇත. වත්මන් සමාජ-ආර්ථික වෙනස්කම්වලට අනුරූපීව පනත මඟින් ආවරණය කරනු ලබන සාමාජික සංඛ්‍යාව වැඩි කිරීම සඳහා සහ සාමාජිකයන්ට ගුණාත්මක හා කාර්යක්ෂම සේවයක් ලබා දීම සඳහා වර්තමානයට ගැළපෙන අයුරින් එකී පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබේ. ඒ අනුව සකස් කරනු ලැබ ඇති මූලික කෙටුම්පත මත පදනම්ව පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**14. ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නගා සිටුවීම සඳහා විස්තීර්ණ උපාය මාර්ග**

ශ්‍රී ලංකාවේ රැකියා උත්පාදනය, නව උත්පාදනයන් වැඩිදියුණු කිරීම සහ ආර්ථික වර්ධනය කෙරෙහි ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සෘජු දායකත්වයක් සපයනු ලබයි. පසුගිය වකවානුව තුළ ශ්‍රී ලංකාව මුහුණ පෑ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දැඩි බලපෑමකට ලක් විය. එබැවින්, එම ව්‍යවසායකයන්

නැවත නගා සිටුවීම සඳහා ආයෝජන සහ කාරක ප්‍රාග්ධන සහාය ලබා දීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන, රජය විසින් උපායමාර්ග ගණනාවක් ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබ ඇත. ඒ අනුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ණය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නැවත සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති අතර, ඒ සඳහා 2024 වර්ෂය වෙනුවෙන් රුපියල් බිලියන 40ක් පමණ වෙන් කරනු ලැබ ඇත. ඊට අමතරව, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් නගාසිටුවීම අරමුණු කර ගනිමින් රුපියල් බිලියන 20ක වටිනාකමකින් යුත් දිරිගැන්වීමේ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා ද 2024-02-24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එකී ප්‍රතිපාදනවලින් රුපියල් බිලියන 02ක් යොදා ගනිමින්, චක්‍රීය අරමුදලක් පිහිටුවා කාන්තා ව්‍යවසායකයින් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, එකී ණය යෝජනා ක්‍රමය 2024-07-01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ එම තොරතුරු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

15. **බලශක්ති අංශයේ ප්‍රතිසංස්කරණ සහ මූල්‍ය තිරසර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු අරමුදල් ලබා ගැනීම**

බලශක්ති අංශයේ ප්‍රතිසංස්කරණ සහ මූල්‍ය තිරසර වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර මූලික සාකච්ඡා පවත්වා ඇත. යෝජිත වැඩසටහන උප වැඩසටහන් 03කින් සමන්විත වන අතර, සෑම උප වැඩසටහනක් සඳහාම ඇමෙරිකානු ඩොලර් මිලියන 100 බැගින් ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක ණය මුදලක් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබයි. ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි (පුද්ගලික) සමාගම යන ආයතනවල ආයතනික ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම පිණිස යෝජිත උප වැඩසටහන - 01 මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක ණය මුදල ලබා ගැනීම පිණිස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. "විගමණික හරසර" වැඩසටහන පැවැත්වීම

2022 වසරේ මුල් භාගයේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය මුහුණ දුන් වෙළෙඳ හිහය අඩු කිරීම සඳහා නීත්‍යානුකූල මාර්ග ඔස්සේ අවම වශයෙන් මසකට ඇමෙරිකානු ඩොලර් මිලියන 500කින් වත් දායක වන ලෙස විගමණික ශ්‍රමිකයන්ගෙන් ඉල්ලීමක් කරන ලදී. එම ඉල්ලීම සඳහා විගමණික ශ්‍රමිකයින් විසින් ලබා දෙන ලද ධනාත්මක ප්‍රතිචාරය මත 2022 ජූනි මස සිට 2024 මැයි මස දක්වා කාලය තුළ ශ්‍රමික ප්‍රේෂණ ඇමෙරිකානු ඩොලර් බිලියන 11ක් දක්වා වර්ධනය වී තිබේ. එබැවින්, මූල්‍ය හා ආර්ථික පසුබෑමේදී විගමණික ශ්‍රමිකයන් විසින් ලබා දුන් මහගු දායකත්වය ඇගයීම වෙනුවෙන් "විගමණික හරසර" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

17. **ඇමෙරිකා එක්සත් ජනපද රජය සමඟ අත්සන් කරන ලද සහයෝගිතා ගිවිසුම් අංක 383 - 128හි තුන්වන සංශෝධනය**

"ප්‍රජාතාන්ත්‍රික, සමෘද්ධිමත් සහ උපද්‍රවවලට මුහුණ දීමේ හැකියාව ඇති ශ්‍රී ලංකාවක් සඳහා වූ වැඩසටහන" මූල්‍යනය කිරීම සඳහා ප්‍රදානයක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා රජය සහ ඇමෙරිකා එක්සත් ජනපද රජය 2022-08-31 දින සහයෝගිතා ගිවිසුමකට එළඹ ඇති අතර, ඒ අනුව ඇමෙරිකානු ඩොලර් මිලියන 9.069ක මුදලක් ශ්‍රී ලංකාවට ලබා දී ඇත. 2023 වසරේදී එම ප්‍රදානයෙහි වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 28.299ක් දක්වා අවස්ථා 02කදී සංශෝධනය කර තිබේ. එම ප්‍රදානයෙහි අගය ඇමෙරිකානු ඩොලර් මිලියන 52.835ක් දක්වා තවදුරටත් ඉහළ නැංවීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඇමෙරිකා එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) විසින් යෝජනා කර තිබේ. ඒ අනුව, "ප්‍රජාතාන්ත්‍රික, සමෘද්ධිමත් සහ උපද්‍රවවලට මුහුණ දීමේ හැකියාව ඇති ශ්‍රී ලංකාවක් සඳහා වූ වැඩසටහන" යටතේ වන ප්‍රදාන අරමුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 52.835 දක්වා ඉහළ නංවමින් සහයෝගිතා ගිවිසුම සංශෝධනය කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

18. **ශ්‍රී ලාංකික තරුණ ව්‍යවසායකයින් සහ ශ්‍රම බලකාය අභිප්‍රේරණය කිරීම සඳහා "වැඩ සංස්කෘතිය" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

තරුණයින් අතර ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නංවාලමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය නගා සිටුවීම සඳහා සැලසුම් කර ඇති ජාතික මුලපිරීමක් වන "වැඩ සංස්කෘතිය" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරුණ සේවා සභාව විසින් ව්‍යාපෘති යෝජනාවක් සකස් කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය 2024 ජූනි මස සිට අගෝස්තු මස දක්වා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර, එමඟින් ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම, විශිෂ්ටත්වය හඳුනාගැනීම, තරුණයින් සම්බන්ධ කර ගැනීම, වැඩ සංස්කෘතියක් දිරිමත් කිරීම සහ ශ්‍රී ලාංකිය තරුණයින් අතර අභිප්‍රේරණය පවත්වා ගැනීම අරමුණු කරයි. ඒ අනුව, තරුණ සංවර්ධන වැඩසටහන යටතේ ජනාධිපති කාර්යාලයට වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් ජාතික තරුණ සේවා සභාව හරහා ශ්‍රී ලාංකික තරුණ ව්‍යවසායකයින් හා ශ්‍රම බලකාය දිරිගැන්වීමේ "වැඩ සංස්කෘතිය" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

************